**ශීර්ෂය 157 - ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම සහ සැසඳුම් ප්‍රකාශනය ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුමෙන් හා සැසඳුම් ප්‍රකාශයෙන් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට ආදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

---

ශීර්ෂය 157 - ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනිම, නීති රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 සැප්තැම්බර් 12 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

---

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශයේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.12 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා

ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 127 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටුකර තිබුණු බව නිරීක්ෂණය විය.

| මුදල් රෙගුලාසි 127 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරී එම විධිවිධානයට අනුගත වී නොතිබීම | නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි | | | |
| 127 (1)(අ) | නිවැරදිව සහ මූල්‍ය විධිමත් බවෙන් යුක්තව කටයුතු කරන බව තහවුරුවන පරිදි සියළු මූල්‍ය කාර්යයන් සැලැසුම් කළ යුතු වීම. | 1. ක්‍රියාකාරී සැලැස්ම නිවැරදි ලෙස පිළියෙල කර නොතිබුණි. | 2.1.1 |
| | | 2. තිරසර සංවර්ධන අරමුණු | 2.1.3 |
| | | 3. ලේඛන හා පොත් පවත්වා නොතිබීම. | 2.9 |
| | | 4. කළමනාකරණ දුර්වලතා | 2.5 |
| 127(1) (ආ) | වියදම් සහ රාජ්‍ය ආදායම් එකතු කිරීම පිළිබඳව ප්‍රමාණවත් තරම් පාලනයකට විධිවිධාන සැලැසෙන ක්‍රමයක් සම්පාදනය කළ යුතුවීම. | 1. අනුකූල නොවීම් | 2.10 |
| | | 2. මානව සම්පත් කළමනාකරණයේ අඩුපාඩු. | 2.11 |
| 127(2) | තමාගේ පාලනය යටතේ පවත්නා දෙපාර්තමේන්තුවල එවකට තිබෙන වැය විෂයයන් මෙන්ම අළුතින් හෝ වැඩියෙන් වියදම් කිරීම සඳහා වන යෝජනා සැකසුරුවම්කම හා කාර්යක්ෂමතාවය අතින් අමාත්‍යාංශයේදී තියුණු පරීක්ෂාවකට භාජනය කිරීම. | 1. කාර්යයන් ඉටු නොකිරීම. | 2.1.2 |
| | | 2. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු | 2.2.1 |
| 127(3) | ස්වකීය පරිපාලනාත්මක කෘතහස්තතාව හා විචාර බුද්ධිය මෙහෙයවා සුදුසු පරිදි ක්‍රියා කළ හැකි වන පිණිස සැකැයක් හෝ උද්ගත වී ඇති සියළු ප්‍රශ්න තමා වෙත ඉදිරිපත් වෙන ආකාරයක් සලසා තිබීම. | 1. වාහන උපයෝජනයේ අඩුපාඩු | 2.3(අ)(i)(ii) |
| | | 2. නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම් | 2.3(ආ) |
| | | 3. රජයේ නිලධාරීන්ගේ ඇප | 2.12 |

| | | | |
|---|---|---|---|
| 127(4) | තමාගේ එක් එක් ගණන්දීමේ නිලධාරියා විසින් විසර්ජන ගිණුම් විධිවූ පරිදි ඉදිරිපත් කරන බවට හා තමා ඒවා අත්සන් කිරීමට පෙර අමාත්‍යාංශයේදී පරීක්ෂා කරනු ලබන බවටත්, එසේම ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල සහ තථ්‍ය වියදම අතර පවත්නා සැලැකිය යුතු වෙනස්කම් තමා විසින්ම, දැඩි ලෙස විමර්ශනයට භාජනය කිරීම | 1. වාර්ෂික අයවැය සීමාව ඉක්මවා බැදීම්වලට එළඹීම | 2.4 |
| | | 2. අග්‍රිම ගිණුමේ අඩුපාඩු | 2.8 |
| 127(5) | දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල හා වියදම අතර ඇති සැලැකිය යුතු වෙනස්වීම් අමාත්‍යාංශයේ දැඩි ලෙස පරීක්ෂණයට භාජනය කෙරෙන බව | සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම | 2.6 |
| 127(6) | ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම පිට පවත්නා වූ ආදායම් නොහොත් රජයට ලැබිය යුතු වෙනත් ගාස්තු එකතු කිරීමේ කාර්යය ගැන දැඩි සෙවිල්ලෙන් සිටිමින් එම කාර්යය අමාත්‍යාංශයේ පරීක්ෂණයකට භාජනය කිරීම | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ සඳහන් අඩුපාඩු | 2.7 |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 2.1 කාර්යසාධනය

#### 2.1.1 සැලැසුම් කිරීම

(i) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ අවශ්‍යතා ප්‍රකාරව 2017 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර තිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂයේදී ප්‍රධාන කාර්යභාරයන් 04 ක් යටතේ ඉටුකළ යුතු කාර්යයන් 30 ක් වෙනුවෙන්, පිළියෙල කර තිබූ රු.මිලියන 75.6 ක මුල් ක්‍රියාකාරී සැලැස්ම රු.මිලියන 300 ක් දක්වා අවස්ථා දෙකක දී සංශෝධනය කර තිබුණි.

(ii) සර්ව ආගමික සමුළුව පැවැත්වීමට සැලසුම් කිරීමේදී අවශ්‍යතාවයන් නිසි පරිදි සැලැසුම් නොකිරීම හේතුවෙන් අතිරේක පුටු සහ මේස වෙනුවෙන් රු. 489,727 ක අමතර පිරිවැයක් දැරීමට සිදුවී තිබුණි.

### 2.1.2 කාර්යයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යයන් ඉටු නොකිරීම**

සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම අනුව කාර්යයන් 30 ක් ඉටු කළ යුතුව තිබුණද, ඉන් කාර්යයන් 17 ක් පමණක් ඉටු කර තිබුණි. එසේ ඉටු නොකළ කාර්යයන් 13 ක් සඳහා එකතුව රු.මිලියන 97.37 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි.

**(ආ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව කාර්යයන් 17ක් සඳහා රු.මිලියන 123.8 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණද, භාෂා අයිතිවාසිකම් අංශයේ කාර්යයන් 02 ක් සහ සහජීවන අංශයේ කාර්යයන් 05 ක් සඳහා එකතුව රු.මිලියන 32.08 ක ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම හේතුවෙන් අපේක්ෂිත නිමැවුම් මට්ටම අත්පත් කරගෙන නොතිබුණි.

### 2.1.3 තිරසර සංවර්ධන අරමුණු

මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශයේ කාර්යභාරය සම්බන්ධව උනන්දුවක් දක්වන පාර්ශවයක් ලෙස රාජ්‍ය භාෂා කොමිසම, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය හඳුනාගෙන තිබුණද, එම උනන්දුවක් දක්වන පාර්ශව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) අමාත්‍යාංශය විසින් තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක හඳුනාගෙන තිබුණද, තිරසර සංවර්ධනය පිළිබඳ පුහුණුවලත් නිලධාරීන් නොමැතිවීම හේතුවෙන් නිශ්චිත සංඛ්‍යාත්මක දර්ශක හඳුනාගැනීම ගැටළු සහගත වී තිබුණ බැව් නිරීක්ෂණය විය.

## 2.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම් හා සේවා ලබා ගැනීම

අමාත්‍යාංශය විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කරමින් සැපයීම් හා සේවා ලබාගත යුතු වූ රු.මිලියන 67.91 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, ඉන් රු.මිලියන 59.01 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| වැය විෂය | වැය විෂය විස්තරය | සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය |
|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| | **සැපයීම්** | | | |
| 1201 | - ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා | 3.60 | 3.39 | 0.21 |
| 1203 | - ආහාරපාන හා නිල ඇඳුම් | 0.21 | 0.14 | 0.07 |
| | **මූලධන වත්කම් අත්පත් කර ගැනීම** | | | |
| 2101 | - වාහන | 43.00 | 39.98 | 3.02 |

| | | | | |
|---|---|---|---|---|
| 2102 | - ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ | 15.50 | 12.91 | 2.59 |
| 2103 | - යන්ත්‍ර හා යන්ත්‍ර උපකරණ | 5.60 | 2.59 | 3.01 |
| | | ------- | -------- | -------- |
| | **එකතුව** | **67.91** | **59.01** | **8.90** |
| | | ===== | ====== | ===== |

## 2.2.1 ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 (අ) මාර්ගෝපදේශය ප්‍රකාරව සියළුම ආශ්‍රිත වියදම් ඇතුළුව මුළු පිරිවැය ඇස්තමේන්තුවක් ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් පිළියෙල කළ යුතුය. කෙසේ වුවද, සහජීවන සංගම් සඳහා රු.මිලියන 11.97 ක කැනපි හට් මිලදී ගැනීම, සහජීවන සංගම් සඳහා රු.මිලියන 5.43 ක පුටු මිලදී ගැනීම, රු.මිලියන 11.23 ක් වූ "People Of Sir Lanka" ග්‍රන්ථය ජනගත කිරීමේ උළෙල සහ රු. මිලියන 6.25 ක් වැයකර සර්ව ආගමික සමුළුව පැවැත්වීම යන ප්‍රසම්පාදනයන් 04 ක් සම්බන්ධයෙන් අවශ්‍ය මුළු පිරිවැය ඇස්තමේන්තු සකස් කර නොතිබුණි.

(ආ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.6.1(අ), (II) හා (IV) මාර්ගෝපදේශ මගින් තාක්ෂණික ඇගයීම් කමිටුවල වගකීම හා කාර්යයභාරයන් අවධාරණය කර තිබුණි. එසේ වුවද එකතුව රු. මිලියන 23.65 ක් වූ සහජීවන සංගම් සඳහා කැනපි හට් හා පුටු මිලදී ගැනීමේදී සහ සර්ව ආගමික සමුළුව පැවැත්වීම වෙනුවෙන් වූ ප්‍රසම්පාදනයන් 3 ක් සම්බන්ධයෙන් මාර්ගෝපදේශයන්ගෙන් බැහැර වීම් නිරීක්ෂණය විය.

**(ඇ) සහජීවන සංගම් සඳහා කැනපි හට් 300 ක් මිලදී ගැනීම**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම තුළ ඇතුළත් වී නොතිබුණු, ගිවිසුම්ගත වටිනාකම රු. මිලියන 11.97 ක් වූ කැනපි හට් 300 ක් මිලදී ගැනීම සඳහා වූ ප්‍රසම්පාදන කාර්යයේදී අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් විසින් නිර්දේශිත ආයතන 6 ක් ඇතුළුව ආයතන 10 කින් මිල ගණන් කැඳවා තිබූ බව අනාවරණය වුවද එය සනාථ කර ගැනීමට ලිඛිත සාක්ෂ විගණනයට ඉදිරිපත් නොවුණි. ආයතන 02 කින් පමණක් මිලගණන් ඉදිරිපත් වීමත් තෝරාගත් සැපැයුම් ආයතනය ඉහත නිර්දේශිත ආයතන 06 න් එකක් වීමක් තුළ 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2 ප්‍රකාරව උපරිම තරගකාරීත්වය හා විනිවිදභාවය තහවුරු වන පරිදි කටයුතු කර නොතිබුණි.

(ii) කොන්ත්‍රාත් දත්ත පත්‍රිකාවේ අංක 18 ප්‍රකාරව කැනපි හට් නිෂ්පාදනය, සැපයීම හා සවිකිරීම පිළිබඳ අවම වශයෙන් අවුරුදු 03 ක අත්දැකීම් තිබිය යුතු වුවද, තෝරාගත් ලංසුකරු මෙම අවශ්‍යතාවයන් සපුරා නොතිබුණි.

(iii) ගිවිසුමේ අංක 26 ප්‍රකාරව කැනපි හට් 300 ක් 2017 නොවැම්බර් 18 දිනට නිෂ්පාදනය කර බෙදාහැරීම සැපැයුම් ආයතනය විසින් සිදුකළ යුතුව තිබුණි. 2018 පෙබරවාරි 16 දින වන විටත් කැනපි හට් 100 ක් පමණක් නිෂ්පාදනය කර තිබීම හේතුවෙන් ඉතිරි කැනපි හට් 200 නිෂ්පාදනය කිරීමේ කාර්යය 2018 අප්‍රේල් 19 දින අවලංගු කර තිබුණි. ගිවිසුම ප්‍රකාරව ප්‍රමාද කාලය වෙනුවෙන් ගාස්තු අය කිරීම සම්බන්ධයෙන්

අවශ්‍ය ප්‍රතිපාදන සලසා නොතිබීම හේතුවෙන් ප්‍රමාද ගාස්තු අයකර ගත නොහැකි තත්ත්වයක් පැන නැඟී තිබුණි.

## 2.3 වත්කම් කළමනාකරණය

ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

### (අ) වාහන උපයෝජනය

අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂය අවසන් වන විට පහත සඳහන් පරිදි වාහන 18 ක් පැවැති අතර, එම වාහනවලින් කිලෝ මීටර් 321,488 ක් ධාවනය කර තිබුණු අතර, ඒ සඳහා ඉන්ධන හා ලිහිසි තෙල් සඳහා රු.මිලියන 4.13 ක්ද, වාහන සේවා කිරීම සඳහා රු.මිලියන 1.03 ක්ද, වාහන අළුත්වැඩියා සඳහා රු.මිලියන 10.52 ක්ද, වාහන රක්ෂණය කිරීම වෙනුවෙන් රු.මිලියන 1.89 ක්ද, වශයෙන් එකතුව රු. මිලියන 17.55 ක් වැය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය විසින් වාහන ධාවනය කිරීම සඳහා (රියදුරු වැටුප් හා දීමනා හැර) කිලෝ මීටරයක් සඳහා වියදම් රු. 28.24 ක සිට රු. 89.91 ක පරාසයක් ගෙන තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

#### (i) ඉන්ධන දහනයවීම් පරීක්ෂා නොකිරීම

2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව අමාත්‍යාංශය සතු වාහන 13 ක ඉන්ධන දහනයවීම ආර්ථිකව සිදු වන බව පරීක්ෂා කර නොතිබුණි.

#### (ii) වාහන අළුත්වැඩියා කිරීම

2001 වර්ෂයේදී ජනාධිපති ලේකම් කාර්යාලය විසින් මිලදී ගෙන තිබූ ඩිපෙන්ඩර් රථයක් 2017 මැයි 24 දින මෙම අමාත්‍යාංශය වෙත පවරා තිබුණි. මෙම රථය සඳහා 2017 සැප්තැම්බර් මාසයේදී ප්‍රධාන අළුත්වැඩියාවන් සඳහා රු.මිලියන 1.43 ක්, සුළු අළුත්වැඩියාවන් සඳහා රු. මිලියන 0.22 ක්ද, සේවා කිරීම් වෙනුවෙන් රු.25,389 ක්ද, හා ඉන්ධන සඳහා රු.4,750 ක් ලෙස එකතුව රු.මිලියන 1.68 ක් වැයකර සැප්තැම්බර්, ඔක්තෝබර් මාසවලදී දින 10 ක් කි.මී.1,117 ක් පමණක් ධාවනය කර තිබුණි. එසේ වුවද නැවතත් 2018 ජනවාරි මාසයේදී අළුත්වැඩියා වියදම් ලෙස රු. මිලියන 1.26 ක් වැය කර තිබුණි.

### (ආ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

සමාජ පරිවර්තන සහ ඒකාබද්ධතා ව්‍යාපෘති සඳහා පහසුකරණය ව්‍යාපෘතියේ (FLICT) ප්‍රතිපාදනවලින් මිලදී ගන්නා ලද කාර්යාල උපකරණ, පරිගණක යන්ත්‍ර හා පරිගණක උපාංග යන වත්කම් අමාත්‍යාංශය වෙත පවරා තිබූ අතර එයින් අයිතම 89 ක් ඌන උපයෝජිතව පැවතුණි. මෙම වත්කම්හි වටිනාකම් ගණනය කර පොත්වලට ගෙන නොතිබුණි.

## 2.4 බැදීම් හා බැරකම්

**(අ) වාර්ෂික අයවැය සීමාව ඉක්මවා බැදීම්වලට එළඹීම**

2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 02(අ) ඡේදයට පටහැනිව වැය විෂයයන් 03 ක් සඳහා සලසා තිබුණු රු.මිලියන 7.66 ක ප්‍රතිපාදනය රු.මිලියන 2.05 කින් ඉක්මවා රු.මිලියන 2.07 ක බැදීම් ඇති කර ගෙන තිබුණි.

**(ආ) බැරකම් අනාවරණය නොකිරීම**

2017 වර්ෂයේ ජාතික අධ්‍යාපන හා පුහුණු ආයතනය මගින් සිදු කරන ලද ක්‍රියාකාරකම් වෙනුවෙන් ගෙවිය යුතු රු.මිලියන 29.5 ක බැරකම් වටිනාකම අනාවරණය කර නොතිබුණි.

## 2.5 කළමනාකරණ දුර්වලතා

රාජ්‍ය නිලධාරීන් විසින් සපුරාගත යුතු රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ඉහළ නැංවීමේ අරමුණින් රාජ්‍ය ආයතනවලින් ඉල්ලුම් කර තිබූ සිංහල අකුරු පොත් අවශ්‍යතාවය සඳහා එකක් රු.1,047.75 බැගින් පොත් 500 ක් රු.523,875 ක වියදමින් මුද්‍රණය කර තිබුණි. එසේ වුවද, ඒ වන විට අමාත්‍යාංශය යටතේ වන රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින්ද මුද්‍රණය කර තිබූ එම පොතෙන්ම පිටපත් 4,919 ක තොගයක් පැවතුණි. 2018 අගෝස්තු මාසය වන විට අමාත්‍යාංශය විසින් එලෙස මුද්‍රණය කළ පොත් 500 න් පොත් 200 ක තොගයක් ඉතිරිව පැවතුණි.

## 2.6 කාර්යභාරයන් ඉටු කිරිම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරිම

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ අමාත්‍යාංශයට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2013 | පුනරාවර්තන | 245.18 | 193.99 | 51.20 | 20.88 |
| | මූලධන | 189.23 | 136.74 | 52.49 | 27.74 |
| | **එකතුව** | **434.41** | **330.72** | **103.69** | **23.87** |
| 2014 | පුනරාවර්තන | 241.97 | 231.46 | 10.51 | 4.35 |
| | මූලධන | 231.12 | 151.93 | 79.20 | 34.26 |
| | **එකතුව** | **473.09** | **383.38** | **89.71** | **18.96** |
| 2015 | පුනරාවර්තන | 287.07 | 260.68 | 26.39 | 9.19 |
| | මූලධන | 305.30 | 145.23 | 160.07 | 52.43 |
| | **එකතුව** | **592.37** | **405.91** | **186.45** | **31.48** |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2016 | පුනරාවර්තන | 363.25 | 327.39 | 35.86 | 9.87 |
| | මූලධන | 309.01 | 124.72 | 184.30 | 59.64 |
| | **එකතුව** | **672.27** | **452.11** | **220.16** | **32.75** |
| 2017 | පුනරාවර්තන | 401.18 | 359.68 | 41.49 | 10.34 |
| | මූලධන | 502.74 | 258.19 | 244.55 | 48.64 |
| | **එකතුව** | **903.92** | **617.87** | **286.05** | **31.65** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වූ වර්ෂ 05 ක කාලය තුළ මූලධන ප්‍රතිපාදන උපයෝජනය සියයට 40 ක සිට සියයට 66 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i) සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම**

වැය විෂයයන් 03 ක් සඳහා සලසා තිබුණු රු.මිලියන 1.1 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් කිසිදු උපයෝජනයක් නොකර මුළුමණින්ම ඉතිරි කර තිබුණි.

**(ii) අධි ප්‍රතිපාදන සලසා තිබීම**

වැය විෂයයන් 18 ක් සඳහා එකතුව රු.මිලියන 474.74 ක අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම වැය විෂයයන්ට අදාළ ප්‍රතිපාදනවලින් එකතුව රු.මිලියන 221.86 ක් පමණක් උපයෝජනය කර තිබීම හේතුවෙන් ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 21 ක සිට සියයට 93 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

## 2.7 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාළ විෂය අංක 15701 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 18.00 | 15.19 | 5.00 | 8.88 | 50.00 | 36.88 |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

**හිඟ හිටි ණය ශේෂ අයකර නොගැනීම**

---

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව 2017 දෙසැම්බර් 31 දිනට රු.36,880,600 ක් වූ මුළු ණය ශේෂය තුළ එකතුව රු. 318,462 ක් වූ ණය ශේෂ 04 ක් වර්ෂ 01 ක සිට 05 කට වැඩි කාල පරාසයක් දක්වා විහිද පැවතුණි. එම ණය ශේෂ අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

**2.8 අග්‍රිම ගිණුම**

---

සමාලෝචිත වර්ෂයේදී අග්‍රිමය සඳහා රු.මිලියන 607.032 ක් ඉල්ලුම් කලද රු.මිලියන 318.48 ක් පමණක් ලැබී තිබුණි. එබැවින් රු.මිලියන 288.55 ක අග්‍රිමයක් නොලැබීම හේතුවෙන් සැලසුම් කරන ලද කාර්යයන් සමාලෝචිත වර්ෂයේදී ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි.

**2.9 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

---

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බැව් නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| **ලේඛන වර්ගය** | **අදාළ රෙගුලාසිය** |
|---|---|
| (අ) ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) |
| (ආ) උප පත්‍රිකා ලේඛනය | මුදල් රෙගුලාසි 341 |
| (ඇ) තාක්ෂණික ඇගයීම් කමිටු පැමිණීමේ ලේඛනය | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය |

**2.10 අනුකූල නොවීම්**

---

**නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

---

1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් පනතේ 6 (1)(අ) උප වගන්තිය අනුව කොන්ත්‍රාත් පිරිවැය රු. මිලියන 5.00 ක් ඉක්මවන්නේ නම්, සෑම කොන්ත්‍රාත්කරුවකුම පොදු කොන්ත්‍රාත් පනත යටතේ ලියාපදිංචි වීම කළ යුතු අතර කොන්ත්‍රාත්තුව පිරිනැමූ පසු දින 60 ක් ඇතුළත කොන්ත්‍රාත් ගිවිසුම ලියාපදිංචි කළ යුතු වුවද, ඉහත සීමාව ඉක්මවූ එකතුව රු. මිලියන 34.88 ක් වටිනා කොන්ත්‍රාත් 04 ක් සම්බන්ධයෙන් පනත ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**2.11 මානව සම්පත් කළමනාකරණය**

---

**අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

---

අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අමාත්‍යාංශය විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු.මිලියන 191.42 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු.මිලියන 0.54 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 25 | 10 | 15 |
| (ii) | තෘතියික මට්ටම | 06 | 04 | 02 |
| (iii) | ද්විතියික මට්ටම | 436 | 250 | 186 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 105 | 91 | 14 |
| | එකතුව | **572** | **355** | **217** |

**කාර්ය මණ්ඩලය පුහුණු කිරීම**

කාර්ය මණ්ඩලය නිතිපතා පුහුණු කිරීමේ අවශ්‍යතාවක් ඇති බැවින් අමාත්‍යාංශය විසින් එහි කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සඳහා රු. මිලියන 0.97 ක් වියදම් කර තිබුණද, සමාලෝචිත වර්ෂයේදී කිසිම ආකාරයේ පුහුණුවක් ලබා නොතිබුණු නිලධාරීන් සංඛ්‍යාව 241 ක් විය. තථ්‍ය කාර්ය මණ්ඩලය හා සසඳන කළ කිසිදු පුහුණුවක් ලබා නොතිබුණු නිලධාරීන්ගේ ප්‍රතිශතය සියයට 68 ක් විය.

## 2.12 රජයේ නිලධාරීන් ඇප තැබීම

අමාත්‍යාංශයේ මුදල් භාරගැනීම සහ භාරව සිටින නිලධාරීන් සහ ගබඩාව භාරව කටයුතු කරන නිලධාරීන් විසින් මුදල් රෙගුලාසි 880 සඳහන් විධිවිධාන ප්‍රකාරව ඇප තැන්පත් කර නොතිබුණි.